විවිධ ක්ෂේත්‍රයන් තුළ ජනප්‍රිය පුද්ගලයන් හා සිදුවන පුවත්පත් සාකච්ඡාවන් තුළදී, ස්ත්‍රීපුරුෂ භාවය ඔස්සේ කාන්තාවන්ව පමණක් ඒකාකෘතික (Stereotype) වන ආකාරයේ ප්‍රශ්න ඇසෙන බව, Ethics Eye අපි මින් පෙරද විමසුමට ගෙන ඇත්තෙමු. එසේ ඇසෙන ප්‍රශ්න ඔස්සේ, පවුල නැතිනම් ගෘහ ජීවිතය හා බැඳි කුදු මහත් කටයුතු, කාන්තාව විසින් පමණක් දැරිය යුතු වගකීම් ලෙසින් ගම්‍ය කෙරෙනා බවද අප මින් පෙර සාකච්ඡාවට ගෙන ඇත්තෙමු.

අනිද්දා පුවත්පතෙහි (ජනවාරි 30, 2022) "දේශපාලනෙයි පවුලයි තුලනය කරගන්නේ කොහොමද?" යන සිරස්තලයෙන් යුතුව, දේශපාලන ක්ෂේත්‍රයේ නියැළෙන කාන්තාවන් කිහිප දෙනෙකු සමගින් සිදුකර ඇති සාකච්ඡාවන් අන්තර්ගත ලිපියද මෙහිදී අපට අවධානයට ගත හැක.

ඔබ සිතනා ආකාරයට,

1) මෙම ලිපිය තුළ "දේශපාලනය සහ පවුල තුලනය කරගන්නේ කොහොමද" යන පැනය කාන්තා දේශපාලන වෘත්තිකයන්ගෙන් පමණක් අසා ඇත්තේ මන්ද? ඒ ඔස්සේ, සිය වෘත්තිය සහ පවුල සමබරව පවත්වාගෙන යෑම කාන්තාවන්ට පමණක් අදාළ කාර්යයක් ලෙසින් ගම්‍ය නොවන්නේ ද?

2) එසේත් නැතිනම්, දේශපාලන ක්ෂේත්‍රයේ නියැළෙන පිරිමින්ගෙන් ද මෙම ගැටළුවම ඇසුණේ නම්, එය වඩාත් ඒකාකෘතික කිරීම් වලින් තොර ලිපියක් වන්නේ නැතිද? ඒ ආකාරයේ ලිපියක් ඉදිරි සතියකදී හෝ ඉදිරිපත් කිරීම 'අනිද්දා' පරමාර්ථය වන්නේ ද?

මෙයට අදාළව අප මින් පෙර පළ කළ පෝස්ට් මෙතැනින්:
**[https://www.facebook.com/ethicseye/posts/1219633968391658](https://www.facebook.com/ethicseye/posts/1219633968391658)**
**[https://www.facebook.com/ethicseye/posts/1226982654323456](https://www.facebook.com/ethicseye/posts/1226982654323456)**